# ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ '' කළමනාකරණ '' සේවා ගණයට අයත් අභ්‍යන්තර විගණක (පුරප්පාඩු 01) යන තනතුර පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති පරිදි සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**1. පත්වීමේ ස්වභාවය.**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත

2. වැටුප් ක්‍රමය

**2.1** සේවා ගණයට අදාළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
2025.04.01 දින සිට
MM 1-1 රු**.** 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240

**3. සුදුසුකම්**

**3.1 බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය, වාණිජවේදී, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් වෙනත් උපාධියක් උපාධියක් ලබා තිබීම.

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01) ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

## 3.2 වයස:-

අවුරුදු **22** ට නොඅඩු විය යුතු අතර **45** ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 3.3 වෙනත්:-

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතු ය.

## 3.4 බඳවා ගැනීමේ ක්‍රමය:-

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවා විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත්කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

### 3.4.1 ලිඛිත තරග විභාගය

විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

- භාෂා ප්‍රවීණතාව
- අභියෝග්‍යතා පරීක්ෂණය

**භාෂා ප්‍රවීණතාව:-**

ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරන රීති භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ හැකියාවන් මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

**අභියෝග්‍යතා පරීක්ෂණය:-**

තනතුරට අදාල කාර්යයන් මනාව ඉටුකිරීමෙහිලා අපේක්ෂකයාගේ අභියෝග්‍යතාව සහ හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි.

විභාගයෙන් සමත්වීම සඳහා අපේක්ෂකයකු විසින් එක් එක් විෂයක් සඳහා නියමිත ලකුණු වලින් අවම වශයෙන් **40%** ක් සහ සියලුම විෂයන් සඳහා මුළු එකතුව අවම වශයෙන් ලකුණු **50%** ක් ලබාගත යුතුය.

### 3.4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීම පහත දැක්වෙන පරිදි වේ:-

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු | **30** |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු | **30** |
| අනෙකුත් කුසලතා / කාර්යය සාධනය | ලකුණු | **15** |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | **25** |
| | | **-----** |
| මුළු ලකුණු ගණන | | **100** |
| | | **===** |

හුදෙක් ම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව කුසලතා අනුපිළිවෙලින් අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

### 3.5 සුදුසුකම් ලබන දිනය

තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත **3.1, 3.2** හා **3.3** වන වගන්තිවල සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

### 3.6 ස්ථිර කිරීම

බාහිර අයදුම්කරුවන් අතුරින් සේවයේ තනතුරේ **II** ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියෙකු වසර තුනක **(03)** පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර**,** ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී තනතුරේ ස්ථිර කරනු ලැබේ.

### 3.7 බඳවා ගැනීමේ වැටුප

තනතුරේ II ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ.

## 4. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. ඔබගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත ලේඛණ ඉදිරිපත් කළ යුතු ය.

**i.** වලංගු ජාතික හැඳුනුම්පත**,** හෝ

**ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**5. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

i. ඔබ විසින් සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් විධායක අධ්‍යක්ෂ, ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, තිඹිරිගස්කටුව, මීගමුව යන ලිපිනය වෙත 2026.05.29 හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

**6. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**7.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**8.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධරයා විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

**විධායක අධ්‍යක්ෂ,**

ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

දිවුලපිටිය පාර

තිඹිරිගස්කටුව

මීගමුව

2026 මැයි මස 03 වන දින